# 03 පස්වග තවුසන් සොයා යාම

සත් සති ගෙවා නිමවූ බුදුරජාණන් වහන්සේ රාජායතනයෙන් පිටත් වී පෙරළා අජපාල නුගරුක මුලට වැඩමකළ සේක. එහි දී උන්වහන්සේට මෙවැනි සිතුවිල්ලක් පහළ විය.



'' මා ඉතා දුක සේ අවබෝධ කළ මේ ධර්මය ශාන්ත ය, ප්‍රණීත ය, තර්කයෙන් වටහාගත නොහැකි ය. එය ගැඹුරු ය. කෙනෙකුට පහසුවෙන් දැකිය නොහැකි ය. අවබෝධය දුෂ්කර ය. තවද ලෝකයේ සත්වයෝ රාග ද්වේශාදියේ ඇලී ගැලී රත්වී වෙසෙන්නෝ ය. ඔවුන්ට මේ ධර්මය අවබෝධ කිරීම පහසු නැත. එනිසා එය දේසනා කිරීමට යෑමෙන් මට වන්නේ වෙහෙසක් පමණි. ''

බුදුරජාණන් වහන්සේගේ මෙම අදහස දැනගත් සහම්පතී මහා බ්‍රහ්මයා සැණෙකින් එහි පැමිණියේ ය. පැමිණ '' ස්වාමීනි, දහම් අවබෝධ කිරීමට සමත්, කෙලෙස් අඩු සත්වයෝ බොහෝ වෙති. බණ අසන්නට නොලැබීමෙන් ඔවුහු පිරිහෙන්නෝ ය. සුගතයන් වහන්ස, එහෙයින් අනුකම්පාකොට දහම් දෙසනු මැනැවැයි '' ආරාධනා කළේ ය.

ඉන් අනතුරු ව උන්වහන්සේ කා හට පළමුව දහම් දෙසම් දැයි සළකා බැලූහ. මුලින් ම උන්වහන්සේගේ සිහියට නැගුණේ සත්‍ය සොයමින්

යනවිට තමාට ගුරු වූ ආළාර කාලාම හා උද්දකරාමපුත්ත යන තවුසන් දෙදෙනා ය. එහෙත් ආළාර කාලාම තුමා ඉන් සතියකට පෙරත් උද්දකරාමපුත්ත තුමා පෙරදින රාත්‍රියේත් මියගොස් තිබුණි.

ඉන්පසුව තමාට දුෂ්කර ක්‍රියා සමයේ උපකාර කළ පස්වග තවුසන්ට දහම් දෙසන්නට තීරණය කළහ. ඒ අනුව උන්වහන්සේ බරණැස් නුවර ඉසිපතනයේ මිගදාය බලා පිටත් වූහ. බෝධීන් වහන්සේටත් ගයාවටත් අතරමග දී උන්වහන්සේට උපක නම් ආජීවකයෙක් හමු විය.

උපක බුදුරජාණන් වහන්සේ දැක පැහැදී ''ඔබේ ඉඳුරන් ප්‍රසන්න ය. ඔබේ ශරීර වර්ණය පැහැපත් ය. ඔබගේ ගුරුවරයා කවරෙක්ද? ඔබ අදහන්නේ කාගේ ධර්මයක්දැ යි'' විමසී ය. එයට පිළිතුරු දෙමින් බුදුරජාණන් වහන්සේ

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බේසු ධම්මේසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයේ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

'' මම සියල්ල අභිබවා සිටිමි. දත යුතු සියල්ල දතිමි. කිසිදු දෙයක නො ඇලී සිටිමි. සියලු කෙලෙස් දුරුකොට නිර්වාණය අවබෝධ කළෙමි. සියලු දේ තමා ම අවබෝධ කරගත් මම ගුරුවරයා ලෙස කවරෙකු දක්වම් ද ''යි පැවසූහ.

මෙය අසා සිටි උපක එසේ නම් ඔබ '' අනන්ත ජින '' විය යුතු යැයි කීය. බුදුරජාණන් වහන්සේ සියලු පාපයන් නැසූ තමන් ජින යැයි කීමට සුදුසු බව පැවසූහ. එය අසා '' එසේ වන්නටත් පුළුවන් '' කියා උපක යන්නට ගියේ ය. බුදුරජාණන් වහන්සේ බරණැස බලා වැඩම කළහ.

ඒ ඇසළ පුණු පොහොය දිනයක් විය. ගංගානම් නදිය පසුකරමින් ඉසිපතනයට ළඟා වූ උන්වහන්සේ සවස් කාලයේ පස්වග තවුසන් හමුවට වැඩම කළහ. උන්වහන්සේ වැඩම කරනු දුරදී ම දුටු ඔවුහු '' ශ්‍රමණ ගෞතමයන් දුෂ්කර ක්‍රියාවෙන් පැරදී සිව්පස බහුල භාවයට වැටී

බුදු විය නොහැකිව ආපසු එන්නේ ය. ඇවැත්නි, අප ඔවුන් වැඳිය යුතු නැත. හුනස්නෙන් නැගිටිය යුතු නැත. පාසිවුරු පිළිගත යුතු නැත. සම්භාවනීය පවුලක උපන් කෙනෙකු වන බැවින් කැමැතිනම් හිඳගන්නට අසුනක් පමණක් දෙමු ''යැයි කතිකා කර ගත්හ.

බුදුරදුන් ළං වන විට සිය කතිකාවතෙහි පිහිටා සිටින්නට ඔවුහු අපොහොසත් වූහ. එක් කෙනෙක් පෙරගමන් ගොස් පාසිවුරු ගත්තේ ය. තවත් කෙනෙක් දෙපා දෝවනය කළේ ය. තවත් කෙනෙක් ආසනයක් පිළියෙල කළේ ය. උන්වහන්සේ ඔවුන් පිළියෙල කළ ආසනයේ වැඩ සිටියහ.

බුදුරජාණන් වහන්සේ සමග සතුටු සාමීචියේ යෙදෙන ඔවුහු '' ඇවැත්නි, ගෞතමයෙනි '' කියා බාල කෙනෙකු අමතන'' ආවුසෝ '' වාදයෙන් කතා කරන්නට වූහ. එහි දී උන්වහන්සේ බුදුකෙනෙකුට ආවුසෝ වාදයෙන් ඇමැතීම සුදුසු නොවන බව පෙන්වා දුන්හ. එහෙත් දුෂ්කර ක්‍රියාවෙන් තොර ව බුදුවීමක් නැතැයි විශ්වාස කළ ඔවුහු උන්වහන්සේගේ බුදුබව නොපිළිගත්හ; දිගට ම ආවුසෝ වාදයෙන් ම ඇමතූහ. දෙවන වර කියද්දීත් ඒ කරුණ නොපිළිගත් විට තුන්වන වර පස්වග තවුසන් ඇමැතූ බුදුරජාණන් වහන්සේ'' මහණෙනි, මා මීට පෙර කිසිදා ඔබට බුදුවූ බවක් කියා ඇත්දැ'යි විමසූහ.

ඔවුහු '' ඔබ වහන්සේ කවදාවත් අපට එසේ ප්‍රකාශ කොට නැත. කිසි දිනක අපි රවටා නැතැ '' යි කියා බුදුරදුන්ගේ බසට එකඟ වූහ. එවිට බුදුරජාණන් වහන්සේ මහණෙනි මම සම්මා සම්බුද්ධ වෙමි. මට ඇහුම්කන් දෙන්න. මම දහම් දෙසමි. ඒ දහම් පිළිපැදීමෙන් සත්‍යාවබෝධය කොට වාසය කරන්නැයි වදාළහ.

**පුහුණුවට**

අහං හි අරහා ලොකෙ - අහං සත්‍ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො - සීතිභූතොස්මි නිබ්බුතො

(අරිය පරියේසන සූත්‍රය)

## අභ්‍යාස

01. බුදුරජාණන් වහන්සේ මුලින් ම ධර්මය දේශනා කිරීමට තීරණය කළේ කාට ද?

02. බුදුරජාණන් වහන්සේ උපක ආජීවකයාට තමන් කවුදැයි හඳුන්වා දුන්නේ කෙසේ දැයි පන්තියට ඉදිරිපත් කරන්න.